# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2085/11 - 2018 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා - 2018.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 7/2001 (III)

### 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

තිලක් මාරපන,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය.

2018 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2018 ජූලි මස 17 වන දින අංක 2080/34 දරන *අති විශෙෂ* ගැසට් පත්‍රයේ පළ කරන ලද 2018 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ (ඉරානයට අදාළව සම්බාධක පැනවීමේ) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 3 වන නියෝගයේ :-

(අ) (අ) ඡේදය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

"(අ) ශ්‍රී ලංකාවේ සිටින සෑම තැනැත්තකුට සහ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින සෑම ශ්‍රී ලාංකික පුරවැසියකුට ;" ;

(ආ) (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :-

(අඅ) කුමන ස්ථානයක පිහිටිය ද ශ්‍රී ලංකාවේ නීතියක් යටතේ සංස්ථාගත කරන ලද සංස්ථාපිත මණ්ඩලයකට ;" සහ

(2) එහි 9 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ) සහ (ඇ) අනුඡේද ඉවත් කර පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :-

"(ආ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් අයිතිය දරනු ලබන හෝ පාලනය කරනු ලබන තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් ;

(ඇ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් ක්‍රියා කරනු ලබන තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් ; හෝ

(ඈ) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක ප්‍රතිලාභය සඳහා,".

09 - 88

1A - PG 4177 — 507 (2018/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*